www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ආන්ඩුව අඥාදායක බලතල සඳහා උද්ඝෝෂනය කරයි

## Sri Lankan government campaigns to entrench autocratic powers

2010 අප්‍රේල් 05

සසප කොලඹ දිස්ත්‍රික් අපේක්ෂිකා

විලානි පීරිස් විසිනි

අප්‍රේල් 08 මහ මැතිවරන ව්‍යාපාරය තුල ආන්ඩුවේ මූලික තේමාව වී ඇත්තේ ව්‍යවස්ථාව වෙනස් කිරීමට හැකිවන පරිදි තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරයක් ලබාගැනීමයි. පාලක හවුල කියා සිටින්නේ ආර්ථික සෞභාග්‍යය උදාකිරීම සඳහා තමන්ට "ශක්තිමත් ආන්ඩුවක්" අවශ්‍ය වන බවයි. වැඩකරන ජනතාවගේ ජීවන තත්වයන් මත ව්‍යසනකාරී ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා ආන්ඩුව පොලිස් රාජ්‍යයක් පැලපදියම් කිරීමේ උත්සාහයක නිරතව සිටින බවට සසප අනතුරු අඟවයි.

පසුගිය සතියේ අරලියගහ මන්දිරයේ සිට කථාකරමින් ජනාධිපති මහින්ද රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේය. "මම වසර තිහක යුද්ධය අවසන් කලෙමි. දැන් මා සංවර්ධන පෙරමුනේ යුද්ධය පටන්ගෙන තිබේ." ඔහු ඡන්ද දායකයන්ට පැවසුවේ "රට ඉමහත් සෞභාග්‍යයක් කරා ගෙනයාමටත් සංවර්ධන ක්‍රියාවලිය වේගවත් කිරීමටත් ශක්තිමත් ආන්ඩුවක් තෝරා පත්කරන්න" යනුවෙනි.

මාර්තු 31 ගාල්ලේ පැවති ප්‍රචාරක රැස්වීමකදී ඔහුගේ සොහොයුරු ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ මෙසේ පැවසීය. "ඇතුලතින් හෝ පිටතින් එල්ලවන කිසිදු බාධාවකින් තොරව ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලිය ඉදිරියට ගෙනයාමට ස්ථාවර පාර්ලිමේන්තු බහුතරයක් සහිත ශක්තිමත් ආන්ඩුවක් අත්‍යවශ්‍යය."

තුනෙන් දෙකේ බහුතරය ලබාගැනීම සඳහා ආන්ඩුව දැවැන්ත ව්‍යාපාරයක් පනගන්වා තිබේ. පුලුල් රැස්වීම් මෙන්ම ප්‍රචාරක පුවරු, පෝස්ටර් මෙන්ම රූපවාහිනී, ගුවන් විදුලි හා පුවත්පත් ඇතුලු රාජ්‍ය මාධ්‍ය ආන්ඩුවේ ප්‍රචාරනය සඳහා මුලුමනින්ම පාහේ යොදාගෙන තිබේ. එහිදී අපක්ෂපාතී නොවීම ගැන වගේ වගක්වත් නැත. වාර්තාවී ඇති මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියාවන්ගෙන් බහුතරය විරුද්ධ පක්ෂ බියගැන්වීම හා ඒවාට පහර දුන් ආන්ඩු ගැති මැරයන්ගේ ක්‍රියාවන්ය.

වර්තමාන සමානුපාතික ඡන්ද ක්‍රමය අහෝසි කිරීම හැරුනුකොට ආන්ඩුවේ කිසිවෙකුත්, යෝජනා කෙරෙන ව්‍යවස්ථාමය වෙනස්කම් කවරේදැයි පැහැදිලිකොට ඇත්තේ නැත. එම වෙනස්කම රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වැනි විශාල පක්ෂ වලට පාර්ලිමේන්තුවේ සිය අධිකාරය පිහිටුවා ගැනීම පහසු කරවයි. එක්සත් ජාතික පක්ෂය (එජාප) හා ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි ප්‍රධාන විරුද්ධ පක්ෂ කිසිවක් ආන්ඩුවට අභියෝග කර ඇත්තේ ද නැත. ඒවායේ කථිකයෝ සීමාවී සිටින්නේ, තුනෙන් දෙකක බහුතරය පිලිබඳ අදහස සඵල කරගත නොහැකි දෙයක් යයි සමච්චලයට ලක්කිරීමට පමනකි.

සමස්ත දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතයම ඡන්ද දායකයන්ගේ ඇස්වලට වැලි ගැසීමේ යෙදී සිටිති. "සංවර්ධන පෙරමුනේ යුද්ධයක්" ගැන කථාකරන විට ජනාධිපති අදහස් කරන්නේ, එල්ටීටීඊයට එරෙහි ඔහුගේ යුද්ධයේ ප්‍රතිපල වශයෙන් කඳුගැසී ඇති නය කන්දරාවේ බර වැඩකරන ජනතාවගේ කරමත පැටවීමේ අවශ්‍යතාවයි. ආන්ඩුවට "කිසිදු බාධාවකින් තොරව" ක්‍රියාකිරීමේ හැකියාව ගැන ඔහුගේ සොහොයුරා කථාකරන විට හෙතෙම අදහස් කරන්නේ, කම්කරු පන්තියේ විරුද්ධත්වය මැඩීම සඳහා 26 වසරක සිවිල් යුද්ධය තුල ගොඩනඟාගත් පොලිස්-රාජ්‍ය ක්‍රමෝපායන් යොදාගැනීම පිලිබඳවයි.

පසුගිය මැයි මාසයේ එල්ටීටීඊය පරාජය කල අවස්ථාවේ ජනාධිපති රාජපක්ෂ, සාමයේ හා සෞභාග්‍යයේ නව යුගයක් පොරොන්දුවූ අතර දැන්, ඊලඟ ආසියානු විශ්මය බවට රට පත් කිරීම පිලිබඳව කථා කරයි. සැබැව නම්, ආර්ථිකය නය බරින් එරී සිටින බවත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල 2011 වන විට අයවැය හිඟය දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 9.7 සිට සියයට 5 දක්වා පහත හෙලිය යුතු යයි ආන්ඩුවට බලකරන්නේය යන්නත්ය. මැතිවරනයෙන් පසුව ආන්ඩුව, පොදු පිරිවැය කැපීමත්, බදු බර නැංවීම හා

රාජ්‍ය ව්‍යවසායන් විකුනා දැමීම මෙන්ම කම්කරුවන්ගෙන් නොවරදවා ම එල්ලවන ප්‍රතිරෝධය මැඩීමත් කල යුතුව තිබේ.

දැනටමත් පොලිස් රාජ්‍යයක සියලු අංගෝපාංග රාජපක්ෂ අත සූදානම්ව තිබේ. යුද්ධය පැවති පසුගිය සිව් වසර තුල ඥාතීන්, ආධාරකරුවන්, ජෙනරාල්වරු හා රාජ්‍ය නිලධාරීන්ගෙන් සැදුම්ලත් පාලක කල්ලියක් ගොඩනැගීම සඳහා ඔහු සිය අසීමිත විධායක බලතල යොදාගත්තේය. ආන්ඩුවේ පත්වීම් අධීක්ෂනය කරන ව්‍යවස්ථාපිත කමිටුවක් පත්කිරීම මඟහැරීම ද ඇතුලු විවිධ අවස්ථාවන්හි දී ඔහු ව්‍යවස්ථාව ද ශ්‍රේෂ්ඨාධිකරනය ද නොතකා හැරියේය.

තිස් වසරක යුද්ධය අවසන් කල බවට රාජපක්ෂ ගසන කයිවාරුව පිටුපස ඇත්තේ කුමක් දැයි වැඩකරන ජනතාව ප්‍රවේශමෙන් සලකා බැලිය යුතුය. ගැටුමේ අවසන් මාසවල දී මිලිටරිය, එල්ටීටීඊ ප්‍රදේශ වෙත ඉවක් බවක් නැතිව සිදුකල බෝම්බ දැමීම් වලින් දහස් ගනන් සිවිල් ජනතාව මරා දැමූහ. එල්ටීටීඊ පරාජයෙන් පසුව පිරිමි, ගැහැනු හා ලමුන් දෙලක්ෂ පනස් දහසකට වැඩි සංඛ්‍යාවක්, ව්‍යවස්ථාව හා නීති පද්ධතිය අමු අමුවේ උල්ලංඝනය කරමින් මිලිටරියේ පාලනය සහිත රැඳවුම් කඳවුරු තුලට ගාල්කරනු ලැබින. 2006 වසරේ පටන් ආන්ඩු ගැති ඝාතක කල්ලි විසින් දේශපාලඥයින්, මාධ්‍යවේදීන් ඇතුලු සිය ගනනක් මිනිසුන් අතුරුදහන් කර හෝ මරාදමනු ලැබ තිබේ.

සටන් නතරවී ඇතත් සමස්ත ආරක්ෂක යාන්ත්‍රනය එලෙස ම පවත්වාගෙන යයි. හමුදාවේ කිසිදු කොටසක් විසුරුවාහැර නැත. ඒ වෙනුවට දිවයිනේ උතුරු හා නැඟෙනහිර ප්‍රදේශවල ස්ථිර මිලිටරි ග්‍රහනය පවත්වාගෙන යයි. රාජපක්ෂ, වැඩ වර්ජන තහනම් කිරීම, නඩු විභාගයකින් තොරව මිනිසුන් රඳවා තැබීම හා මාධ්‍ය වාරනය සඳහා ඉඩ සැලසෙන හදිසි නීති එසේම පවත්වාගෙන යයි. පසුගිය ඔක්තෝබරයේදී ඛනිජ තෙල්, විදුලි බල, ජල හා වරාය කම්කරුවන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගය තහනම් කිරීම සඳහා ඔහු මේ බලතල යොදා ගත්තේය.

ජනවාරි මාසයේ ජනාධිපතිවරනය අවසන්වීමත් සමඟ අසාමාන්‍ය බියගැන්වීමේ ව්‍යාපාරයක් ආන්ඩුව විසින් දියත් කලේය. විපක්ෂ අපේක්ෂක විශ්‍රාමික ජෙනරාල් සරත් ෆොන්සේකා හා ඔහුගේ ආධාරකරුවන් දුසිම් ගනනක් කුමන්ත්‍රනයක් සැලසුම් කරමින් සිටියේය යන ගොතන ලද චෝදනා යටතේ ආන්ඩුව විසින් අත්අඩංගුවට ගනු ලැබුනි. එම ප්‍රකාශය සනාථ කලහැකි සාක්ෂි කිසිවක් පොලිසිය විසින් ඉදිරිපත් නොකිරීම නිසා ඉන් බොහෝ දෙනෙක් නිදහස්කර තිබේ. කෙසේ වෙතත්, මිලිටරිය විසින් වැසූ දොරවල් පිටුපස පවත්වනු ලබන නඩු විභාගය, රාජ්‍ය ද්‍රෝහී වීම පිලිබඳව නොව එයට අසම්බන්ධිත සාපේක්ෂ සුලු චෝදනා යටතේ සිදුකරනු ලබයි.

දැනටමත් අසීමිත බලතල සතුකරගත් රාජපක්ෂ "ප්‍රබල ආන්ඩුවක්" සඳහා කරන කැඳවුමෙහි අර්ථය කුමක් ද? එය මූලිකව එල්ල කර ඇත්තේ, එල්ටීටීඊ යට එරෙහි යුද්ධයේ අවසානය තෙක්ම ඊට පිටුබලය දුන් හා කම්කරුවන් මත අලුතෙන් බර පැටවීම මඟින් මෙරට ධනවාදය රැකගත යුතුය යන එකඟත්වය ද සහිත, විපක්ෂයේ එජාප හා ජවිපෙට එරෙහිව නොවේ.

ආන්ඩුවේ ප්‍රධාන එල්ලය වැඩ කරන ජනතාවයි. ව්‍යවස්ථාව වෙනස්කිරීමේ බලය ද රාජපක්ෂට හිමිවුවහොත් සිය බලතල තහවුරු කරගෙන, නීතිය තුලින් ගෙනඑන ඕනෑම අභියෝගයක් මඟහරවා පාර්ලිමේන්තුව රබර් මුද්‍රාවක් බවට පිරිහෙලීමට ඔහුට හැකිවනු ඇත. එල්ටීටීඊයට එරෙහි යුද්ධය පැවති වකවානුව තුල ජනාධිපති, වැඩවර්ජනය කල කම්කරුවන් ජාතික ආරක්ෂාව අනතුරේ හෙලන ද්‍රෝහීන් ලෙස යලි යලිත් හෙලා දුටුවේය. ඔහුගේ නව "සංවර්ධනය සඳහා යුද්ධය" තුලින් ඔහු, රටේ ආර්ථිකයට වලකපන්නේ යයි කම්කරුවන්ට චෝදනා කරමින් වෘත්තීය ක්‍රියාමාර්ග හා විරෝධතා මත කඩාපැනීම යුක්තිසහගත කිරීම සඳහා ඒ හා සමාන තර්කයක් ගොඩනගනු ඇත.

අතීත ආන්ඩුවලට පැහැදිලි බහුතරයක් හිමිවූ විට සිදුවූයේ කුමක් දැයි කම්කරුවන් සිහියට නගාගත යුතුය. හිටපු ට්‍රොට්ස්කිවාදී ලංකා සමසමාජ පක්ෂය හා ස්ටැලින්වාදී කොමියුනිස්ට් පක්ෂය සමඟ හවුලේ රාජපක්ෂගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) ආසන 151 කින් 115 ක්ම දිනාගනිමින් 1970 මැතිවරනයෙන් පැහැදිලි ජයග්‍රහනයක් හිමිකර ගත්තේය. සිරිමා බන්ඩාරනායකගේ නායකත්වයෙන් යුත් ආන්ඩුව, 15,000 පමන වෙතැයි ගනන් බලා ඇති ගම්බද තරුනයන් සංඛ්‍යාවක් මරාදමමින් ජවිපෙ කැරැල්ල මඬිනු ලැබුනි. එය ඉන්පසුව, අවසානයේ යුද්ධය පුපුරා යාමට මග හෙලිකල වාර්ගික ආතතීන් උග්‍ර කරමින් සිංහල රාජ්‍ය භාෂාව ලෙසත් බුද්ධාගම රාජ්‍ය ආගම ලෙසත් පැලපදියම් කලේය. මහජන විරෝධය නැඟී එද්දී ආන්ඩුව සිය පාලන කාලය දෙවසරකින් දිගු කර ගැනීමට ව්‍යවස්ථාව වෙනස් කලේය.

1977 දී එවකට පැවති ආර්ථික අර්බුදය මධ්‍යයේ ජේ. ආර්. ජයවර්ධන යටතේ එජාපය, ආසන 168 කින් යුත් පාර්ලිමේන්තුවේ ආසන 140 ක ඉමහත් බහුතරයක් සහිතව ජයග්‍රහනය කලේය. ආන්ඩු විසුරුවා හැරීමත්, පාර්ලිමේන්තුව කල් තැබීමත් ඇතුලු අසීමිත බලතල සහිතව වත්මන් විධායක ජනාධිපති ක්‍රමය පිහිටුවීම සඳහා එජාප කඩිනමින්ම ව්‍යවස්ථාව වෙනස් කලේය. නව ව්‍යවස්ථාව යටතේ ඔහුගේ ආන්ඩුවට

කල නොහැක්කේ ''ගැහැනියක මිනිසෙකු කිරීමටත් මිනිසෙකු ගැහැනියක කිරීමටත් පමනක්'' බවට ජයවර්ධන පම්පෝරි ගැසීය. වෙලඳපොල ගැති ප්‍රතිව්‍යුහකරනය ක්‍රියාවට නැඟීම ආරම්භ කල ලෝකයේ සිටි ප්‍රථම රාජ්‍ය නායකයන් අතරින් කෙනෙකු වූ ඔහු, 1980 දී වැඩවර්ජනය කල රජයේ සේවකයන් ලක්ෂයක් නෙරපා හැරීමට සිය විධායක බලතල යොදාගත්තේය. සමාජ ආතතීන් වැඩී යන තත්වය හමුවේ එජාප, 1983 යුද්ධය පුපුරා යාමට මං පෑදූ දෙමල විරෝධී වර්ගවාදය ඇවිස්සීමටත් ජන ඝාතනයන්ටත් නැඹුරු විය.

අද දිනයේ අර්බුදය බොහෝ පැතිවලින් වඩාත් සංකීර්නය. 26 වසරක යුද්ධය රටේ ආර්ථිකය බිඳ දමා ව්‍යසනයකට ඇද දමා ඇත්තේ, 1930 ගනන් වලින් පසුව ඇතිව තිබෙන ගෝලීය ආර්ථිකයේ නරකම බිඳවැටීම මධ්‍යයේ ය. මූල්‍ය ප්‍රාග්ධනය ඉල්ලා සිටින්නේ තමන් ගලවා ගැනීමේ ප්‍රතිපල වශයෙන් ලෝකය පුරා ආන්ඩු අත කඳුගැසී තිබෙන නය බර, වැඩකරන ජනතාව මත පැටවිය යුතු බවයි. එය ප්‍රජාතන්ත්‍රවාදී ආකාරයෙන් ඉටුකරගත නොහැකිය. රාජපක්ෂ ද මෙය හොඳකාරව ම දැන සිටියි. විසිපස් වසරක යුද්ධයේ බිහිසුනු විනාශයෙන් දැනටමත් බැටකා සිටින කම්කරුවන් හා තරුනයන් ප්‍රතිරෝධය දක්වනු ඇත.

කෙසේ වෙතත් කම්කරු පන්තිය, සිය පන්ති අවශ්‍යතා සඳහා සටන්වදින පක්ෂයක් නොමැතිවීමේ අන්තරායට මුහුන දී සිටියි. සියලු විරුද්ධ පක්ෂ ආන්ඩුවේ ආර්ථික න්‍යායපත්‍රයට සහාය දක්වති. ආන්ඩු ගැති, විපක්ෂ ගැති හා "ස්වාධීන" වෘත්තීය සමිති මෙන්ම විවිධ වර්ගයේ හිටපු රැඩිකලුන්ගේ සහාය, හාම්පුතුන්ට හා රාජපක්ෂ තන්ත්‍රයට එරෙහි කුමන හෝ දේශපාලන අරගලයක් කඩාකප්පල් කිරීම සඳහා නැතුව ම බැරිය.

කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ආන්ඩුවක් ද සමාජවාදී ප්‍රතිපත්ති ද සඳහා සටනේදී, සියලු ධනපති පක්ෂවලින් ස්වාධීනවූ දේශපාලන ව්‍යාපාරයක් තුල සිංහල, දෙමල හා මුස්ලිම් කම්කරුවන් හා තරුනයන් එක්සත් කර බලමුලු ගැන්වීමට සමාජවාදී සමානතා පක්ෂය මෙම මැතිවරනයට ඉදිරිපත්ව සිටියි. මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් හා මනා ජීවන තත්වයන් සඳහා අරගලය, ධනපතියන්ගේ ලාභය සඳහා නොව වැඩකරන ජනතාවගේ සමාජ අවශ්‍යතා සපුරාලීම සඳහා සමාජය ප්‍රතිනිර්මානය කිරීම සමඟ අත්‍යන්තයෙන්ම බැඳී තිබේ. සසප සටන් කරන්නේ, දකුනු ආසියාවේ ද ජාත්‍යන්තරව ද සමාජවාදය සඳහා අරගලයේ කොටසක් ලෙස ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් වෙනුවෙනි. මෙම ඉදිරිදර්ශනය සමඟ එකඟවන කම්කරුවන්ගෙන් හා තරුනයන්ගෙන් අප ඉල්ලා සිටින්නේ අපගේ ව්‍යාපාරයට ක්‍රියාශීලීව සම්බන්ධවන ලෙසත් කම්කරු පන්තියේ මහජන පක්ෂය ලෙස සසප ගොඩනඟන ලෙසත්ය.

© www.wsws.org